කවරෙකු තම ලිංගය ස්පර්ශ කළේද ඔහු වුළූ ධෝවනය කරත්වා!

උර්වා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මම මර්වාන් ඉබ්නු හකම් තුමා වෙත පිවිසුනෙමි. වුළූවෙහි කරුණු සම්බන්ධයෙන් එතුමා අපට මෙනෙහි කළහ. එවිට මර්වාන් තුමා කවරෙකු ලිංගය ස්පර්ශ කළේ දැයි විමසා සිටියහ. එවිට උර්වා ඒ ගැන මම නොදනිමි
යැයි පැවසූහ. එවිට මර්වාන් තුමා අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්රකාශයට තමන් සවන් දී ඇති
බව බුස්රා බින්ත් සෆ්වාන් තුමිය මට මෙසේ දන්වා සිටියාය. එනම්: "කවරෙකු තම ලිංගය
ස්පර්ශ කළේද ඔහු වුළූ ධෝවනය කරත්වා!" [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - ඉමාම් අබූ
දාවූද් එය වාර්තා කර ඇත]

උර්වා -රළියල්ලාහු අන්හු- තුමා දන්වා සිටි හදීසයේ තේරුම වනාහි, නියත වශයෙන්ම එතුමා මර්වාන් ඉබ්නු හකම් තුමා වෙත පැමිණියේය. එතුමා එවකට මදීනාවේ පාලකයා විය. වුළූවෙහි කරුණු සම්බන්ධයෙන් එතුමා අපට මෙනෙහි කළහ. එනම්, වුළු අවලංගු වන ක්රම හා වුළූ අවලංගුවන කරුණු පිළිබඳව අප පරිශීලනය කරමින් මෙනෙහි කරමින් සිටියෙමු යන්නයි. එවිට මර්වාන් තුමා “කවරෙකු ලිංගය ස්පර්ශ කළේ දැ“යි විමසා සිටියහ. එනම්, ලිංගය ස්පර්ශ කිරීමත් වුළූ අවලංගු කරන කරුණු අතුරින් වූවක් යැයි පවසා සිටියහ. එවිට උර්වා ඒ ගැන මම දැන සිටියේ නැතැයි පැවසූහ.එනම්: එයට කිසිදු සාධකයක්ම මම නොදනිමි. ඒ සම්බන්ධයෙන් අල්ලාහ්ගේ දූතයාණන් විසින් ලබා ගත් කිසිදු දැනුමක් මට නැතැයි යන්නයි. එවිට මර්වාන් තුමා අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්රකාශයට තමන් සවන් දී ඇති බව බුස්රා බින්ත් සෆ්වාන් තුමිය මට මෙසේ දන්වා සිටියාය. එනම්: "කවරෙකු තම ලිංගය ස්පර්ශ කළේද ඔහු වුළූ ධෝවනය කරත්වා!" යන්නයි. තිර්මිදිහි සඳහන් තවත් වාර්තාවක, “වුළූ ගන්නා තෙක් සලාත් ඉටු නොකරත්වා!“ යැයි සඳහන්වී ඇත. සැබැවින්ම ආශාවෙන් යුතුව හෝ ආශාවෙන් තොරව හෝ සිතාමතාම හෝ නොසිතාම හෝ ලිංගය ස්පර්ශ කිරීම වුළූ අවලංගු කරන්නක් බවට කදිම සාධකයකි මෙම වාර්තාව. නමුත් එය ඍජු ස්පර්ශයක් විය යුතුය. එනම් ඒ දෙක අතර කිසිදු ආවරණයක් නොවිය යුතුය. ආවරණයක් මත එය සිදු වූයේ නම් එසේ ස්පර්ශ කිරීමෙන් කිසිදු බලපෑමක් ඇති නොවන්නේය. හේතුව එය සැබෑ ස්පර්ශ කිරීමක් නොවන බැවිනි. ස්පර්ශ කිරීම යනු අවයවයක් තවත් අවයවයක් මත ඍජුව ස්පර්ශවීමය. ඉමාම් නසාඊ තුමා හා අනෙකුත් ඉමාම්වරු විසින් වාර්තා කොට ඇති හදීසය මෙයට සාධකයක් ලෙස පිහිටා ඇත. එනම්: “ඔබ අතුරින් කිසිවකු තම අත තම ලිංගය වෙත ගෙන යන්නේ නම් ඒ අතර කිසිදු ආවරණයක් හෝ තිරයක් හෝ නොවී නම් ඔහු වුළු ගනිත්වා“ සුබුලුස් සලාම් (1/97) ෆත්හු දුල් ජලාලි වල් ඉක්රාම් (1/260) තව්ලීහුල් අහ්කාම් (1/298)

http://www.sunnah.global/hadeeth/si/show/8397